සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

වාර්ෂික වාර්තාව *2022/23*



කර්මාන්ත අමාත්‍යාංශය

(ප්‍රාථමික කර්මාන්ත අංශය)

දැක්ම

“එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් පොස්පරස් පෝෂක මඟින් අපගේ මාතෘභූමියේ සාරවත් පසක් නිර්මාණය කිරීම”





මෙහෙවර

“පරිසර හිතකාමී සහ නව ක්‍රියාවලියක් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සපුරාලීම"

පටුන

- හැඳින්වීම 01
- අධ්‍යක්ෂක මණ්ඩලය 02
- කළමනාකරණ කණ්ඩායම 03-04
- සභාපතිතුමාගේ ප්‍රකාශය 05-06
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 07-09
- මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය 2022/23 10-13
- මූල්‍යමය ඉස්මතු කිරීම් 14
- ආයතනික ව්‍යුහය 15
- අනුමත කාර්ය මණ්ඩලය 16
- විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 17
- විගණකවරුන්ගේ වාර්තාව 18-25
- මූල්‍ය ප්‍රකාශන
  - කාල පරිච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 26
  - 2023.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 27
  - කාල පරිච්ඡේදය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 28
  - කාල පරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 29
  - මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 30-44
  - ආයතනික තොරතුරු, සැළකිය යුතු ගිණුම්කරණය විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන 45-53
- රැස්වීම් වාරය දැනුම්දීම 54
- පෙරකලාසියේ ආකෘතිය 55

හැඳින්වීම

සමාගමේ නම

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (PB 308)

පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය

සී/ස ලංකා පොස්පේට් ආයතනය 1992 ජූලි මස 10 වන දින සීමිත වගකීමක් සහිත සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් හා බණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය ලෙස 1987 අංක 23 දරණ පොදු සංස්ථා හෝ රජයට අයිතිය පවරා ගන්නා ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ පනත යටතේය. කෙසේ නමුත් 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ මෙකී සමාගම නැවත ලියාපදිංචි කරනු ලැබ ඇත.

මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

බහු වාර්ෂික කෘෂි භෝග සඳහා පොහොර වශයෙන් යොදවන පාෂාණ පොස්පේට් කැනීම් සැකසුම සහ අලෙවි කිරීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

ජී.ඒ.එම්.එස්.ජී.අබන්වෙල මහත්මිය	-	සභාපති
ජී.ඩබ්ලිව්.එම්.යූ.ෆොන්සේකා මහත්මිය	-	අධ්‍යක්ෂ
ආචාර්ය එස්.එච්.ජී.මන්ජුල මහතා	-	අධ්‍යක්ෂ
කේ.ඩී.එස්.අබේපාල මහතා	-	අධ්‍යක්ෂ
ඩී.එම්.බී.ජී.ජයතිලක මහතා	-	අධ්‍යක්ෂ
එල්.එන්.ජී.පෙරේරා මහතා	-	අධ්‍යක්ෂ

සමාගමේ ලේකම්
කල්රුප්කෝ මැනේජ්මන්ට් සර්විස් (පුද්ගලික) සමාගම, අංක 06, බලහේනමුල්ල පාර, කොළඹ 06

අවසාන මැ සමාගම
ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්ට මෙම සමාගමේ නිකුත් කළ කොටස් පිළිබඳව සම්පූර්ණ අයිතිය ඇත.

රේඛීය අමාත්‍යාංශය
කර්මාන්ත අමාත්‍යාංශය,
ප්‍රාථමික කර්මාන්ත අංශය,
නො : 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05

ලියාපදිංචි කාර්යාලය
අංක 73 1/1, නව කැළණි පාලම පාර,
කොළඹ 14.
දුරකථන අංකය - 0112459906/7
ෆැක්ස් අංකය - 0112459908

විගණකවරු
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය,
නො : 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

බදු උපදේශකවරු
අමරසේකර සහ සමාගම
වරලත් ගණකාධිකාරවරු,
නො.12 - රොටුන්ඩා උද්‍යානය,
කොළඹ 03.

බැංකුකරුවන්

ලංකා බැංකුව
මහජන බැංකුව
ජාතික ඉතිරිකිරීමේ බැංකුව

අධ්‍යක්ෂක මණ්ඩලය



පී.ඒ.එම්.එස්.පී.අබන්වෙල මහත්මිය
සභාපති



පී.ඩබ්ලිව්.එම්.යූ.ෆොන්සේකා මහත්මිය
අධ්‍යක්ෂ



ආචාර්ය එස්.එච්.පී.මන්ජුල මහතා
අධ්‍යක්ෂ



කේ.ඩී.එස්.අබේපාල මහතා
අධ්‍යක්ෂ




එල්.එන්.පී.පෙරේරා මහතා
අධ්‍යක්ෂ



ඩී.එම්.බී.පී.ජයතිලක මහතා
අධ්‍යක්ෂ

කළමනාකරණ කණ්ඩායම



එච්. ආර්. යූ. ඩී. බණ්ඩාර මහතා
සාමාන්‍යාධිකාරී



ආර්.එම්.පී. කරුණාරත්න මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී



ඩී. පී. යූ. චාමර මහතා
මූල්‍ය කළමනාකරු



එස්.ඩී. රූපසිංහ මහතා
මෙහෙයුම් කළමනාකරු



එම්.එම්.ඩී. තිලකරත්න මහතා
මානව සම්පත් කළමනාකරු



කපිතාන් කේ.පී.ආර්.පී. කිරිඇල්ල මහතා
ආරක්ෂක කළමනාකරු



ඩී. ආර්.කේ. තිලකරත්න මහතා
ගණකාධිකාරී



ආර්. ඒ. ඒ. පී. රණසිංහ මහතා
අලෙවි විධායක



ඩී.බී. කීරියාවත්ත මහතා
අභ්‍යන්තර විගණක



එල්.එල්.ඩී.අයි. පැතුම් මහතා
නිෂ්පාදන ඉන්ජිනේරු



ඒ.එම්.සනත් බණ්ඩාර මහතා
යාන්ත්‍රික ඉංජිනේරු



එස්. ඒ. අබේසිරි මහතා
සැපයුම් නිළධාරී



එස්.එම්.ඒ.ආර්.කේ. මංචනායක මහතා
කාර්ය මණ්ඩල නිළධාරී (පරිපාලන හා මානව සම්පත්)



ඩී.ආර්. ගුණරත්න මහතා
කම්හල් නිළධාරී



ඩී.එස්.එම්. දිසානායක මහතා
ගබඩා නිළධාරී

සභාපතිවරයාගේ ප්‍රකාශය

පොස්පේට් පාෂාණය කෘෂිකර්මාන්තයට හා අනෙකුත් කර්මාන්තවලට උපයෝගී කරගන්නා බොහෝ ප්‍රයෝජන ඇති වැදගත් ඛනිජ ප්‍රභවයකි. ශාක වැඩීමට හා ප්‍රවර්ධනයට පොස්පේට් ඉතා අත්‍යාවශ්‍ය පෝෂකයකි. ගෝලීය පොස්පේට් පරිභෝජනය පොහොර නිෂ්පාදනයේ සිට සේදුම්කාරක නිෂ්පාදන කර්මාන්තය, පිඟන් කර්මාන්තය හා වෙනත් කර්මාන්ත විශාල ගණනකට අදාළ වේ. ලෝක වෙළඳපොළ තුළ රොක් පොස්පේට් වඩාත් ස්වාභාවික හා තිරසාර බැවින් රසායනික පොස්පේට්, පොහොර සඳහා කාබනික අදේශකයක් ලෙස පිළිගනු ලැබේ.

ලෝක පොස්පේට් සංචිත සීමාසහිත වන අතර නැවත ජනනය නොවේ. එමනිසා ඒවා උපරිම හා තිරසාර ක්‍රියාවලියක් තුළ ප්‍රයෝජනයට ගත යුතුයි. ලෝකයේ පොහොසත්ම සහ අසම සම පොස්පේට් නිධියක් ලෙස සළකන ශ්‍රී ලංකාවේ පොස්පේට් සංචිතය 33% - 40% ක පමණ P_2O_5 ඛණිජ අඩංගුවේ. 1971 දී එප්පාවල පොස්පේට් නිධිය සොයාගත් අතර, එය පොස්පේට් මෙ.ටො. මිලියන 60ක සංචිතයකි. ශ්‍රී ලංකාවේ දේශීය පොස්පේට් පොහොර අවශ්‍යතාවය සපුරාලීමට ලංකා පොස්පේට් සමාගම රොක් පොස්පේට් පොහොර නිපදවීම සිදුකරයි. වර්තමාන ධාරිතාව අනුව ලංකා පොස්පේට් සමාගම දේශීය අවශ්‍යතාවය සඳහා එප්පාවල රොක් පොස්පේට් (ERP) මෙ.ටො 50,000ක් පමණ වාර්ෂිකව නිපදවන අතර, එය පුද්ගලික හා රාජ්‍ය පොහොර සමාගම් හරහා ගොවියන් වෙත බෙදාහරී.

වර්තමානයේ සමාගම විසින් එප්පාවල රොක්පොස්පේට් (ERP) සහ අධි - ශ්‍රේණියේ එප්පාවල රොක්පොස්පේට් (HERP) යනුවෙන් රොක්පොස්පේට් වර්ග දෙකක් නිපදවනු ලබන අතර මේවා ශ්‍රී ලංකාවේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර ලෙස භාවිතා කරනු ලැබේ.

රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් වලට පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ කොන්දේසි යටතේ පොස්පේට් සමාගම 1992 ජූලි මස 10 වන දින සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීමටය. මෙම සමාගමෙහි සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාර ලේකම්තුමා සතුවෙයි. 1998 නොවැම්බර් මස බෝගල ග්‍රැෆයිට් සමාගමෙන් වෙන්වීමත් සමඟ ලංකා පොස්පේට් සමාගම සම්පූර්ණයෙන්ම ස්වාධීන ආයතනයක් බවට පත්විය.

රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුව ලංකා පොස්පේට් සමාගමට මෙරට පොහොර නිෂ්පාදන කර්මාන්තයේ ප්‍රමුඛ හා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට සිදුවේ.

2022/2023 මූල්‍ය වර්ෂය අවසානයේ අත්පත් කරගත් රු. මිලියන 546 ක දළ පිරිවැටුම පසුගිය වසරේ රු. මිලියන 741 ක් වූ දළ පිරිවැටුමට සාපේක්ෂව සැළකිය යුතු අඩුවීමකි. පෙර වර්ෂවලට සාපේක්ෂව රටේ පොහොර නිෂ්පාදනය අඩුවීමක් සමඟම 50% කින් විකුණුම් පහළ යෑම හේතුවෙන් සමාගම වසර 02 කට පසුව රු.මිලියන 48.6ක මෙහෙයුම් අලාභයක් වාර්තා කරන ලදී. කෙසේවෙතත්, සළකා බලන කාල පරිච්ඡේදයේ බැංකු පොළී අනුපාතවල සහ අනෙකුත් ආදායම්වල සැළකිය යුතු වැඩිවීම හේතුවෙන් සමාගමට රු. මිලියන 60.6 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට හැකියාව ලැබී ඇත. එසේම, සමාගම විසින් ස්වයංක්‍රීයකරණ පද්ධති හා නව තාක්ෂණ ක්‍රියාවලි සඳහා හඳුන්වාදීමට සැළසුම් කර තිබුණද අරමුදල් නොමැතිකම හා ද්‍රවශීලතා ගැටළු නිසා එය ඉටුකර ගත නොහැකි විය.

එප්පාවල පොස්පේට් නිධියේ උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට අදාළව පවත්නා හා නව ව්‍යාපාරික අවස්ථා දියුණු කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. රටේ සමස්ත කෙටි කාලීන බෝගවලට අවශ්‍ය වඩාත් ගැලපෙන පොස්පේට් වර්ග නිපදවීම ජාතික අවශ්‍යතාවයක් සහ වැදගත්කමක් ලෙස අප හඳුනාගෙන තිබේ. එමනිසා, සමාගමේ මීළඟ ක්ෂණික අවශ්‍යතාවය ලෙස SSP, දේශීයව නිෂ්පාදනය හඳුන්වාදීමේ මූලික පියවර දැනටමත් ආරම්භ කර ඇත.

ඒ අතරම, කළමනාකරණය විසින් අපනයන වෙළෙඳපොළට ඇතුළුවීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා අවශ්‍යවන නෛතික සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලමින් සිටී.

වගකිව යුතු රාජ්‍ය සමාගමක් ලෙස ලංකා පොස්පේට් සමාගම රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව ක්‍රියාකරන අතරම, සීමිත සම්පත් යටතේ වුවද ප්‍රථම ප්‍රමුඛතා සහිතව ප්‍රමිතගත ක්‍රියාවලි සහ යටිතල පහසුකම් හඳුන්වා දී ජාත්‍යන්තර ගුණාත්මක ප්‍රමිතීන් යටතේ රොක් පොස්පේට් නිෂ්පාදනයට කටයුතු කරයි.

තවද, මානව හිතවාදී සේවා පරිසරයක් සහ සෑම තරාතිරකම සේවකයන් සඳහා ඔවුන්ට අදාළ ක්ෂේත්‍රවල නව වර්ධනයක් ඇති කිරීමට කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් හඳුන්වා දීමට ද පියවර ගෙන ඇත.

අවසාන වශයෙන්, මේ සම්බන්ධයෙන් අප වෙත මඟ පෙන්වීම, ධෛර්‍යය, සහයෝගය හා දේශපාලන නායකත්වය ලබාදෙන කර්මාන්ත අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයට සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුදකරමි.

ලංකා පොස්පේට් සමාගමට එහි ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරමි.

පී.ඒ.එම්.එස්.පී.අබන්වෙල
සභාපති
ලංකා පොස්පේට් සමාගම

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සී/ස ලංකා පොස්පේට් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම් සහ 2023 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරයි.

1.0 සමාගමේ නම

සී/ස ලංකා පොස්පේට් සමාගම (ලි.ප.අ. PB 308)

2.0 පිහිටි ස්ථානය හා නීතිමය ස්වරූපය

රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාවෙහි එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1992 ජූලි 10 වන දින සංස්ථාගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබීය.

3.0 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික කෘෂිකාර්මික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම් සිදුකිරීම, සකස් කිරීම හා අලෙවි කිරීමයි.

4.0 මූල්‍ය ප්‍රකාශනය

මේ සමඟ අමුණා ඇති මූල්‍ය ප්‍රකාශනයෙන් වාර්තා කරන දිනට සමාගමේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටී.

මෙම මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගනිමින් ඒවාට අනුරූපව සාධාරණව සහ ඒකාකාරීව නිගමන හා තක්සේරුකිරීම් සිදු කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. මෙම වාර්තාවේ අනාවරණය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැති බව ඔවුන්ගේ අදහසයි. සමාගමේ අධ්‍යක්ෂකවරු විසින් වත්කම්වල සුරක්ෂිතභාවය රැක ගැනීමටත්, වංචා සහ අනෙකුත් අවිධිමත් කටයුතු වලක්වාගැනීමට සහ අනාවරණය කරගැනීමටත් පියවර ගෙන ඇත.

5.0 මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගණුදෙනුවේ ස්වභාවය සහ හරය මනාව පිළිඹිබු වන පරිදි එයට අදාළ විනිශ්චයන් සහ ඇස්තමේන්තුවලට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඇති බවට අධ්‍යක්ෂක මණ්ඩලය සැලකිලිමත් විය.

6.0 දේපළ, පිරියත හා උපකරණ, ඒවායේ ගණනය කිරීම් සඳහා ක්ෂයවීම්

වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ සඳහා දරා ඇති ප්‍රාග්ධන වියදම රු. 41,679,878.00 කි. එයට රු. මිලියන 36.45ක් වූ නව TGM 160 මීල් යන්ත්‍ර වියදම හා රු.මිලියන 3.2 ක් වූ විදුලි අලි වැටෙහි වියදම ආදී සැළකිය යුතු මුදලක් අන්තර්ගත වේ. දේපළ, පිරියත හා උපකරණවල තත්ත්වය හා චලනයන්, ඒවායේ තක්සේරු කිරීම සහ ක්ෂය වීම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 5.0 හි දක්ව ඇත.

7.0 බදුකරණය

සමාගම වසර ආරම්භයේදී ව්‍යාපාරික ආදායම සඳහා 18% ක් සහ වෙනත් ආදායම් සඳහා 24% ක් බදු අයකරන ලදී. මෙම බදු අනුපාතය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වසරේ අග භාගයේදී 30% ක් දක්වා සංශෝධනය කරන ලද අතර, ඒ අනුව ඉහත ව්‍යවස්ථාපිත වෙනස්කම්වලට අනුකූලවීම සඳහා වසරේ පළමු සහ දෙවන කොටස් සඳහා 24% ක් සහ 30% යන අනුපාත දෙකක් අදාල කරගැනීමට සමාගමට සිදුවිය, කෙසේවෙතත්, වසර සඳහා ව්‍යාපාරික ලාභයක් ලබාගැනීමට සමාගමට නොහැකි විය.

8.0 ලාභාංශ

සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 200 ක ප්‍රකාශිත ලාභාංශයක් ගෙවන ලදී.

9.0 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය වූ රුපියල් 72,510,000/-, සාමාන්‍ය කොටස් 7,251,000 කින් සමන්විත වේ. සමලෝචනයට භාජනය කරන වසර ඇතුලත ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනසක් සිදුවී නොමැත.

10.0 කොටස් හිමිකාරීත්වය

1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රාජ්‍ය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ 2(3) වගන්තියට අනුව එකම කොටස්කරු වනුයේ රජය වෙනුවෙන් (රාජකාරී මට්ටමින්) භාණ්ඩාගාරික ලේකම්ය.

2023 මාර්තු 31 දිනට සමාගමේ කොටස් හිමිකාරීත්වය පිළිබඳ විස්තර පහත සඳහන් වන පරිදිවේ.

භාණ්ඩාගාර ලේකම්ට (රාජකාරී මට්ටමින්) සාමාන්‍ය කොටස් 7,251,000 කි.

සී/ස GSMB ටෙක්නිකල් සර්විස් පුද්ගලික සමාගමේ කොටස්කරුවෙක් වන සී/ස ලංකා පොස්පේට් සමාගම සාමාන්‍ය කොටස් 100,000 ක හිමිකාරීත්වය දරයි. (එකක් රු.10/- බැගින්)
මෙහි හිමිකාරීත්වය දැරීමේ ප්‍රතිශතය 16.66% කි.

11.0 කොටස් හිමිකාරීත්වයේ වෙනස්වීම

සමාගමේ කොටස් හිමිකාරීත්වයේ කිසිදු වෙනස්වීමක් 2023 මාර්තු 31 දින වන විට සිදුවී නැත.

12.0 සංස්ථාපිත සමාජ වගකීම

සමාලෝචනයට භාජනය වූ වසර තුල පුණ්‍ය **කටයුතු සහ** ආයතනික සමාජ වගකීම් **සඳහා සමාගම විසින් සැලකිය යුතු දායකත්වයක් ලබා දී** නොමැත.

13.0 සේවකයින්

වර්ෂය ඇතුලත සම්පූර්ණ සේවක මණ්ඩල පිරිවැය රුපියල් 320,409,745/- වර්ෂය අවසානය වන විට සමාගම විසින් සේවයේ යොදවා ඇති සාමාන්‍ය සේවක සංඛ්‍යාව 315 ක් වේ.

14.0 අධ්‍යක්ෂකවරුන්

සමාලෝචිත වසර ඇතුලත පහත සඳහන් අය අධ්‍යක්ෂ තනතුරු දැරීය.

පී.ඒ.එම්.එස්.පී.අබන්වෙල මහත්මිය	-	සභාපති
පී.ඩබ්ලිව්.එම්.යූ.ෆොන්සේකා මහත්මිය	-	අධ්‍යක්ෂ
ආචාර්ය එස්.එච්.පී.මන්ජුල මහතා	-	අධ්‍යක්ෂ
කේ.ඩී.එස්.අබේපාල මහතා	-	අධ්‍යක්ෂ
ඩී.එම්.බී.පී.ජයතිලක මහතා	-	අධ්‍යක්ෂ
එල්.එන්.පී.පෙරේරා මහතා	-	අධ්‍යක්ෂ

15.0 අධ්‍යක්ෂකවරුන් පත්වීම හා ඉල්ලා අස්වීම

කේ.එස්.අයි. සුබසේන මහතා - සභාපති (2022.09.14),
ආර්.එම්.විජේසිංහ බණ්ඩා මහතා - අධ්‍යක්ෂ (2022.09.15),
ඒ.පී.මොරගොඩ මහතා - අධ්‍යක්ෂ (2022.08.22),
ඩී.ආර්.ටී රුවන්පුර මහතා - අධ්‍යක්ෂ (2022.08.22)
ජේ.ඒ.ඩබ්ලිව්.ජයසූරිය මහතා - අධ්‍යක්ෂ (2022.08.22),
සුදත් අබේවර්ධන මහතා - අධ්‍යක්ෂ (2022.08.22)
ඩබ්ලිව්.එල්.ජී. සමරසිංහ මහතා - අධ්‍යක්ෂ (2023.01.09)
වසර තුල ඉල්ලා අස් වූ අතර, පී. තිලංග නදීර මහතා - සභාපති (2022.12.09),
මහාචාර්ය චන්දන පී. උඩවත්ත - අධ්‍යක්ෂ (2022.12.22),
ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන මහතා - අධ්‍යක්ෂ (2022.12.09),
රුබන් වික්‍රමාරච්චි - අධ්‍යක්ෂ (2022.12.22)
අලුතින් පත්වූ අතර නැවත 2022/2023 වසර තුලදීම ඉල්ලා අස්විය.

16.0 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය/වියදම

සමාලෝචිත වර්ෂය ඇතුලත රුපියල් 3,039,390 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ගාස්තු හා වියදම වශයෙන් ගෙවා ඇත.

17.0 ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම දැනීමේ සහ විශ්වාසය අනුව රජයට, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් නිවැරදිව සහ නියමිත දිනට කර ඇත.

18.0 අනුකූලවීම

සමාගම ශ්‍රී ලංකාවේ හෝ අන්තැනකට අදාල නීතිරීති හෝ රෙගුලාසිවලට පටහැනි ක්‍රියාකාරකම්වල නිරතවී නොමැත.

19.0 අඛණ්ඩ බවේ පැවැත්ම

සමාගමේ මෙහෙයුම් කටයුතු ඉදිරි අනාගත කාලයක් දක්වා පවත්වා ගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් ව්‍යාපාරය සතුව පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටින අතර ඒ අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිලියෙල කර ඇත. ඒ පිළිබඳ හෙළිදරව්වක් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යටතේ දක්වා ඇත.

20.0 සංස්ථාපිත පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය හොඳ සංස්ථාමය පාලනයක් සහතික කර ඇත. පොදු ව්‍යාපාරයක් වශයෙන් කොටස්කරුවන්ගේ අපේක්ෂා සහ අරමුණු මෙන්ම සමාගමේ අරමුණු වලට සමාන්තරව එහි කාර්යසාධනය පවත්වාගෙන යෑම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

21.0 අවදානම් කළමනාකරණය

සමාගම විසින් නීතිමය අවදානම අඩු කිරීම හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහතික කිරීම සඳහා ව්‍යවස්ථාපිත සහ නීතිමය අවශ්‍යතාවයන් ඉටුකර ඇත.

22.0 විගණකයින්

සමාගමේ වර්තමාන විගණකවරු ලෙස රජයේ විගණකාධිපති කටයුතු කරයි.

විගණකවරුන්ගේ පාරිශ්‍රමිකය සම්බන්ධව තීරණය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට බලය පැවරිය යුතු බවට වන යෝජනාවක්ද වාර්ෂික මහා සභා රැස්වීමේදී සලකා බැලීමට කටයුතු කොට ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා 2023 මාර්තු 31 දිනට සමාගම විසින් සපයන ලද මුළු විගණන ගාස්තුව රුපියල් 400,000 ක් විය. බදු උපදේශන සේවා සැපයීම වෙනුවෙන් අමරසේකර සහ සමාගමට වර්ෂය සඳහා රුපියල් 236,432/- ක මුදලක් ගෙවන ලදී.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහස පරිදි මෙම සමාගම හෝ එහි අනු සමාගම් සමඟ විගණකයින්ගේ ස්වාධීනත්වයට බලපෑමක් වන ආකාරයේ කිසිදු සම්බන්ධතාවයක් නොවීය.

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන්:

සභාපති


G.W. MADUSHA UDANI FONSEKA
Director
අධ්‍යක්ෂක

මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය 2022/23


01. පිරිවැටුම/ආදායම

2021/2022 වර්ෂයේ රුපියල් මිලියන 741.5 ක හා සසඳන විට සමාගම මිලියන 546.1 පිරිවැටුමක් වාර්තා කර ඇත. මෙය ප්‍රමාණයෙන් 50% කින් සහ වටිනාකමින් 26% කට වඩා කැපී පෙනෙන පහත වැටීමකි. 2022 ඔක්තෝම්බර් මාසයේ මිල සංශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස රුපියල් වටිනාකම අඩු ප්‍රතිශතයකින් පහත වැටී ඇත. වසර තුළ රොක් පොස්පේට් සඳහා අඩු ඉල්ලුමක් ඇති වූයේ අනෙකුත් මිශ්‍ර කිරීමේ අමුද්‍රව්‍යවල අධික මිල (UREA, MOP) සහ එම ද්‍රව්‍ය වෙළඳපොලේ අඩුවෙන් තිබීම හේතුවෙනි.

වටිනාකම (රුපියල් මිලියන)




ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)



02. ලාභය


මෙහෙයුම් ලාභය

2022/2023 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් අලාභය රු.මිලියන 48.61 කි. එය 2021/2022 රු.මිලියන 119.37ක් වූ මෙහෙයුම් ලාභය සමඟ සැසඳීමේදී කැපී පෙනෙන පහත වැටීමකි. අවම විකුණුම් සහ ස්ථාවර පොදු කාර්ය සඳහා කැපවීම ඉහත ප්‍රතිඵල සඳහා හේතුවිය.




බදුවලට පෙර ලාභය (PBT)

වසර සඳහා මෙහෙයුම් අලාභය තිබියදීත්, සමාගම සතු ස්ථාවර තැන්පතු වලින් ලැබෙන ඉහළ පොළී ආදායම හේතුවෙන් රුපියල් මිලියන 60.58 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට හැකිවිය.




03. ශුද්ධ වත්කම - (කොටස්කරුවන්ගේ අරමුදල්)

ශුද්ධ වත්කමෙහි තත්ත්වය රු.බිලියන 1.07 සිට බිලියන 1.05 දක්වා අඩුවූ අතර වසර පුරා සෘණාත්මක මෙහෙයුම් ප්‍රතිඵල ඊට හේතු වී ඇත.



04 මුළු වත්කම

වර්ෂය තුළ මුළු වත්කමෙහි වටිනාකම රුපියල් බිලියන 1.184 සිට බිලියන 1.315 දක්වා ඉහළ ගොස් ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ සමාගමේ ජංගම වත්කම් ලෙස වර්ග කර ඇති සාමාන්‍ය තොගය සහ ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොළීවල වැඩිවීමයි.



ව්‍යාපෘති සහ යටිතල පහසුකම් සංවර්ධනය

I. 2014 වසරේ මිලදී ගත් මෙම නව මිල් යන්ත්‍රය රුපියල් මිලියන 36.4 ක වියදමින් ස්ථාපනය කර නිෂ්පාදන ක්‍රියාවලියට එක් කරන ලදී.

II. රුපියල් මිලියන 3.2 ක වියදමින් මිනිසුන්ගේ සහ දේපළවල ආරක්ෂාව සඳහා එප්පාවල වැඩබිමේ ඉදිකරන ලද විදුලි අලිවැට.

III. දැනට පවතින රසායනාගාර පහසුකම් ජාතික හා ජාත්‍යන්තර සහතිකකිරීමේ මට්ටම දක්වා වැඩිදියුණු කිරීම මඟින් නියැදි පර්යේෂණ හා තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය සංවර්ධනය කරන ලදී. (රසායනාගාර ප්‍රතීතනය) (අදියර 1 - ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 5.2)

IV. පරිසර හිතකාමී ව්‍යාපෘතියක් ලෙස සූර්ය බලශක්ති උත්පාදනය සඳහා එප්පාවල කර්මාන්ත ශාලාවේ වහලය කුළියට දීමට කටයුතු කරමින් සිටී.

V. අක්‍රීය තත්ත්වයේ පවතින පිරියත සහ යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමටත්, සමාගමේ නිත්‍ය මෙහෙයුම් සඳහා ඒවා යොදා ගැනීමටත් කටයුතු කරමින් සිටී. (උදා : ක්‍රෂර් යන්ත්‍රය)

VI. වැසි දිනවලදී සහ අධික අව්ව සහිත දිනවල කිසිදු බාධාවකින් තොරව පැටවීමේ ධාරිතාව වැඩි කිරීම සඳහා නිමි ද්‍රව්‍ය ගබඩාවේ වහලය පුළුල් කිරීම.

VII. කාර්ය මණ්ඩල අභිප්‍රේරණය සහ සුභසාධකය සඳහා එප්පාවල වැඩබිමේ කම්කරු නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කර තිබුණි.

VIII. මෙහෙයුම්වල ඵලදායිතාව, නිරවද්‍යතාවය සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා පවතින ගිණුම්කරණ මෘදුකාංග පැකේජය වැඩිදියුණු කිරීමට කටයුතු කරමින් පවතී.

සාමාන්‍යාධිකාරී

මූල්‍ය ඉස්මතු කිරීම්

වර්ෂය සඳහා **(රු. '000)**

	2022/23	2021/22	2020/21	2019/20	2018/19
ආදායම	546,100	741,553	750,374	510,004	530,975
බදුවලට පෙර ලාභය / (අලාභය)	60,582	157,030	150,582	13,480	29,694
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය)	35,284	122,783	124,017	5,489	33,385
මුළු විස්තීර්ණ ආදායම	7,227	147,631	117,494	18,821	109,726

වර්ෂ අවසාන දිනට (Rs. '000)

	2022/23	2021/22	2020/21	2019/20	2018/19
කොටස්හිමියන්ගේ අරමුදල්	1,050,746	1,068,519	950,888	831,378	771,646
කාරක ප්‍රාග්ධනය	845,858	798,299	685,183	528,312	477,360
මුළු වත්කම්	1,315,376	1,184,905	1,099,694	948,648	892,603
කාර්ය මණ්ඩල පිරිවැය	320,410	351,356	325,078	303,310	292,861
සේවක සංඛ්‍යාව **(ගණන)**	315	336	325	333	328


කොටසකට

	2022/23	2021/22	2020/21	2019/20	2018/19
ඉපැයීම් **(රුපියල්)**	4.87	16.93	17.10	0.76	4.68

අනුපාතයන්

	2022/23	2021/22	2020/21	2019/20	2018/19
දළ ලාභ අනුපාතය	37.8%	46.8%	46%	37%	35.6%
බදු පෙර ලාභ අනුපාතය	11.1%	21.2%	20.1%	2.6%	5.6%
ජංගම අනුපාතය **(වාර)**	5.70	13.97	10.70	14.56	11.67
කොටස්හිමියන්ගේ අරමුදලට ප්‍රතිලාභ **(%)**	3.36%	11.49%	13.04%	0.66%	4.33%

ආයතනික ව්‍යුහය


ORGANIZATION STRUCTURE OF LANKA PHOSPHATE LIMITED (24-04-2015)
CHAIRMAN
GENERAL MANAGER
DEPUTY GENERAL MANAGER (NON PRODUCTION)
DEPUTY GENERAL MANAGER (PRODUCTION)
HUMAN RESOURSCE MANAGER (ADMIN & HR)
OPERETION MANAGER
FINANCE MANAGER
SECURITY MANAGER
ASST. MARKETING MANAGER
ASST. SUPPLIES MANAGER
ACCOUNTANT
PRODUCTION MANAGER
MACHANICALE ENGINEER
PRODUCTION ENGINEER
INTERNAL AUDITER
PERSONAL AND ADMINISTRATIVE OFFICER
STORE OFFICER
SUPPLIES OFFICER
MILL OFFICER
ASSISTANT SECURITY OFFICER
ASST. PROCU. OFFICER
ASST. MKT. OFFICER
ASST. IT OFFICER
ASST. FINANCE OFFICER
BOOK KEEPER
STORE KEEPER
ASST. TRANSPORT OFFICER
GARDEN SUPERVISOR
ASST. WEL. OFFICER
PERSONAL ASSISTANT
ADMIN & HR ASST.
ASST. Q.C OFFICER
ASST. MILL OFFICER
ASST. FIELD OFFICER
FOREMAN (MECHANICAL)
FOREMAN (CIVIL)
MANAGEMENT ASSISTANT
SECURITY SERGENT
SECURIT GARD
LAB AIDET
FORK LIFT OPERATO
MACHINE OPERATOR
ASST. MACHINE OPERATOR
SERVICEMAN (BAG CLOSER MACHINE)
MACHINE OPERATOR
STORE MAN
MINER
WELDER/ FITTER
MOTOR MACHANIC
ELECTRICI AN
ASST. ELECTRICIAN
PUMP MAN
MASO N
CARP ENTE
STORE MAN
SALESMAN
OFFICE AIDE
PRODUCTION AIDE
MAINTENANCE AIDE
WHEEL LODRE OPERAT
DRIVER
MACHA -NICAL DRIVER
SERVICE MAN (VEHICLE)
STORE MAN
CLEANER
FIRST AIDER
LIBRARY ASSISTA
BUNGL OWEPE
TELEPHONE OPERATOR
GARDEN AIDE
HM 2-1
HM 1-3
HM 1-1
MM 1-1
JM 1-1
MA 2-1
MA 1-1
PL 3
PL 2
PL 1
3/11/2019 3:30:49 PM

අනුමත කාර්ය මණ්ඩලය

කාණ්ඩය	වැටුප් කේතය	තනතුර	තනතුරු අංකය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු	HM - 2-1	සාමාන්‍යාධිකාරී	01
	HM - 1-3	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නිෂ්පාදන	01
		නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- නිෂ්පාදන නොවන	01
	HM - 1-1	මූල්‍ය කළමනාකරු	01
		නිෂ්පාදන කළමනාකරු	01
		මෙහෙයුම් කළමනාකරු	01
		පරිපාලන හා මානව සම්පත් කළමනාකරු	01
මධ්‍යම/මැදපෙළ කළමනාකරු	MM - 1-1	ගණකාධිකාරී	01
		යාන්ත්‍රික ඉන්ජිනේරු	01
		නිෂ්පාදන ඉන්ජිනේරු	01
		අභ්‍යන්තර විගණක	01
		සහකාර සැපයුම් කළමනාකරු	01
		සහකාර අලෙවි කළමනාකරු	01
		ආරක්ෂක කළමනාකරු	01
කනිෂ්ඨ කළමනාකරු	JM - 1 – 1	සැපයුම් නිළධාරී	01
		පරිපාලන නිළධාරී (පරිපාලන හා මානව සම්පත්)	01
		කම්හල් නිළධාරී	01
		ගබඩා නිළධාරී	01
කළමනාකාර සහායක	MA 2-1		28
	MA 1-1		30
ප්‍රාථමික මට්ටම	PL - 3		73
	PL - 2		80
	PL - 1		120
මුළු ගණන			**349**

විගණක සහ කළමනාකරණ කමිටුවේ වාර්තාව

සංයුතිය

විගණන සහ කළමනාකරණ කමිටුව යනු, අධ්‍යක්ෂ මණ්ඩලයට වගකියන අනු කමිටුවකි. කමිටුවේ සභාපතිවරයා මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂකවරයා වන අතර, තවත් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු කමිටුවේ අනිකුත් සාමාජිකයන් වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරියෙකු සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා නිරීක්ෂකයින් ලෙස කමිටුව නියෝජනය කරයි.

රැස්වීම්

විගණන සහ කළමනාකරණ කමිටුව 2022/2023 වසර තුළ සිව් වතාවක් රැස්වීමට හැකිවිය. සමාගමේ වත්කම්වල ආරක්ෂාව සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරුන් මෙන්ම බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද විගණන වාර්තා සහ පවතින පාලනවල කාර්‍යක්ෂමතාව කමිටුව විසින් සමාලෝචනය කර ඇගයීමට ලක්කරන ලදී.

නිගමනය

වාර්තාව සියුම් ලෙස පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, මෙහෙයුම් පාලන විධි හා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඉස්මතු වී ඇති ගැටළු නිවැරදි කිරීම සඳහා කළමනාකාරීත්වයට කමිටුව විසින් උපදෙස් දෙන ලදී. තවද තීරණාත්මක කරුණු කිහිපයක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ලට හා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කරන ලදී.

G.W. MADUSHA UDANI FONSEKA
Director

සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව
සී/ස ලංකා පොස්පේට් සමාගම

විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } අයිඩබ්ලිව්එම්/සි/එල්පීඑල්/1/22 මඹේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 දෙසැම්බර් 15 දින

සභාපති,

ලංකා පොස්පේට් ලිමිටඩ්.

ලංකා පොස්පේට් ලිමිටඩ්හි 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලංකා පොස්පේට් ලිමිටඩ්හි ("සමාගම") 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සමාගම විසින් බනිජ ඇඹරුම් යන්ත්‍ර සඳහා යොදනු ලබන රබර් බුෂ් ඒකකයක් රු.350 ක් බැගින් දේශීය සමාගමකින් මිලදී ගෙන විගණිත දින වූ 2023 සැප්තැම්බර් 14 දක්වාම යන්ත්‍ර සඳහා භාවිතා කරමින් පැවතුණි. අදාළ භාණ්ඩ ඒකක 81 ක් ගබඩාවේ පැවතියදී තොගය ශූන්‍ය බව දක්වමින් 2022 දෙසැම්බර් 17 දින රබර් බුෂ් ඒකක 200 ක් ඒකකයක් රු.79,082 ක් බැගින් රු.15,816,482 කට ආනයනය කර තිබුණි. ඒ අනුව රු.70,000 ක් වැනි අවම පිරිවැයක් යටතේ මිලදී ගැනීමට හැකිව තිබූ අදාළ අයිතම තොගය ඉතා ඉහළ වටිනාකමකට ආනයනය කිරීම තුළින් රු.15,746,482 ක අලාභයක් සමාගමට සිදුව තිබුණි. මිලදී ගත් මෙම තොගය විගණිත දින වූ 2023 සැප්තැම්බර් 14 වන විටත් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යව තබා තිබූ අතර මිලදී ගැනීමේ දී එම රබර් බුෂ්වලට අමතරව Coupling bolt ඒකක 198 ක්ද ඒ සමඟ ලැබී තිබුණද එම ඇණ වලින් අදාළ යන්ත්‍රයට කිසිදු ප්‍රයෝජනයක් නොමැති බැවින් ඒවා නිෂ්කාර්යව තබා තිබුණි.

(ආ) සමාගම අංක LPL/SUP/-HO/F1-B1D/2022/05 දරන ප්‍රසම්පාදනය මගින් රු.86 බැගින් පොහොර ඇසුරුම් මළු 1,200,000 ක් රු.103,200,000 කට මිලදී ගැනීමට සැපයුම්කරුවෙකු වෙත කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.10 ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කර නොතිබුණි. සැපයුම්කරු ඇසුරුම් මළු 26,400 ක් රු.86 බැගින් ලබාදී ඉන් පසු සැපයූ මළු 1 ක මිල රු.120 හා රු.147 දක්වා වැඩිකර තිබුණි. මේ අනුව ගිවිසුම්ගතව නොතිබීමෙන් හා කාර්යසාධන සුරක්ෂණ ලබා නොගැනීම හේතුවෙන් රු.61,705,000 කට පොහොර ඇසුරුම් මළු 717,500 ක් මිලදී ගත හැකිව තිබියදී

රු.96,407,500 ක් වැය කර මිලදී ගැනීමට සිදුවීමෙන් සමාගමට රු.34,704,500 ක පාඩුවක් වී තිබුණි.

(ඇ) සමාගමේ TGM-160 Six Roller ඇඹරුම් යන්ත්‍රය සඳහා රු.5,656,344 කට Gear Box උපාංගයක් 2022 වර්ෂයේදී චීනයේ Henan Liming Heavy Industry Machinery Sales Co. Ltd ආයතනය වෙතින් ආනයනය කර තිබුණි. මේ සඳහා තරහකාරී හා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි. මීට අදාළ 2021 නොවැම්බර් 24 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙන් අදාළ සැපයුම්කරු දකුණු ආසියානු කලාපයේ TGM ඇඹරුම් යන්ත්‍ර අමතර කොටස් සැපයීමේ නියෝජිතයා හේතුවෙන් එම ආයතනයෙන් අදාළ උපාංගය මිලදී ගැනීම යෝග්‍ය බවට නිර්දේශ ලබාදී තිබුණද ප්‍රසම්පාදනයේ වටිනාකම, භාණ්ඩයේ පිරිවිතරයන් සහ තරහකාරී සැපයුම්කරුවන් පිළිබඳ විධිමත් ඇගයීමක් සිදුකර නොතිබුණි. අදාළ භාණ්ඩය 2023 මැයි 10 වන දින ආයතනයේ ප්‍රධාන ගබඩාව වෙත ලැබී තිබුණු අතර මේ සම්බන්ධයෙන් පත්කළ ආයතනික සාමාජිකයින්ගෙන් සැදුම් ලත් පරීක්ෂණ මණ්ඩලයක් විසින් 2023 ජූනි 12 දින ලබාදී ඇති වාර්තාව ප්‍රකාරව ඉල්ලුම් කරන ලද සහ සත්‍ය වශයෙන් ආයතනය වෙත ලැබී ඇති Gear Box උපාංගයේ මාදිලියේ වෙනසක් ඇති බැවින් උපාංගය පිළිගත නොහැකි බවට නිර්දේශ කර තිබුණි. ඒ අනුව විගණිත දින වූ 2023 ඔක්තෝබර් 05 දක්වා මෙම උපාංගය ගබඩා ලේඛනවලට ඇතුළත් කිරීමකින් තොරව ගබඩාවේ රඳවාගෙන තිබුණු අතර මිලදී ගැනීමේදී සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ සැපයුම්කරු සමඟ එකඟතාවයකට පැමිණීමට නොහැකිව තිබුණි. මිලදී ගැනීමට අදාළ ඇණවුමේ වටිනාකම වූ රු.4,802,850 (ඇ.ඒ.ජ.ඩො.13,000) සම්පූර්ණයෙන්ම සැපයුම්කරු වෙත 2022 සැප්තැම්බර් 15 දින ගෙවා තිබුණි. උපාංගය සඳහා මාස 15 ක වගකීම් කාලයක් සැපයුම්කරු විසින් ලබාදී තිබුණද විගණිත දින වූ 2023 ඔක්තෝබර් 05 දින වන විටත් එයින් මාස 07 ක කාලයක් අවසන්ව පැවතුණි.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.34,427,525 ක් වූ ණය ගැනි ශේෂය තුළ බොල්ණය ලෙස ප්‍රතිපාදනය කර තිබූ වර්ෂ 05 ට වැඩි අයවිය යුතු ණය ශේෂවල එකතුව රු.9,769,506 ක් වූ අතර විගණිත දිනය වන විටත් මෙම ශේෂයන් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේදී රු. 35,867,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු ක්‍රෂර් යන්ත්‍රයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සමාගම් පරිශ්‍රයේ නිෂ්කාර්යව තබා තිබුණු අතර මීට අදාළ රඳවා ගැනීම් රු.4,386,358 ක් ද නිරවුල් කිරීමෙන් තොරව 2014 වර්ෂයේ සිට උපචිත වියදම් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.82,925,144 ක බැංකු අයිරාවක් පැවතුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.9,749,495 ක අයිරා පොලී ගෙවා තිබුණි.

(ඈ) සමාගම විසින් සෑම වර්ෂයකම ඇඹුරුම් යන්ත්‍ර සඳහා අමතර කොටස් මිලදී ගෙන තිබූ අතර එහිදී තරහකාරී මිල ගණන් කැඳවීමකින් හෝ දේශීය සැපයුම්කරුවෙකු වෙතින් මිලදී ගැනීමට ඇති හැකියාව සොයා බැලීමෙන් තොරව සෘජුවම යන්ත්‍රය මිලදී ගත් ආයතනයෙන් මිලදී ගෙන තිබුණි. තවද, එහිදී අමතර කොටස්වල අවශ්‍යතාවය ඇගයීමක් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. 7,229,928 ක් වටිනා අමතර කොටස් තොගයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඉ) සමාගම නිෂ්පාදනය කරනු ලබන එප්පාවල රොක් පොස්පේට් (ERP) සහ අධිශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP) පොහොර තොග වල පැවතිය යුතු පොස්පේට් (P_2O_5) ප්‍රතිශතය පරීක්ෂා කරනු ලබන UV-Visible Spectrophoto යන්ත්‍රය යල්පැන යාම හේතුවෙන් එමගින් ලබාදෙන තොරතුරුවල නිරවද්‍යතාවය සම්බන්ධ ගැටලු පැනනැගි තිබුණි. අදාළ යන්ත්‍රයෙන් තත්ත්ව පරීක්ෂාවන් සිදුකර අලෙවි කරන ලද පොහොර මෙට්‍රික් ටොන් 3,173 ක තොග අපේක්ෂිත ප්‍රමිතියට අනුකූල නොවීම හේතුවෙන් සමාගම වෙත ආපසු එවා තිබුණි.

(ඊ) සමාගම විසින් අලෙවි කරනු ලැබූ පොහොර වල පැවතිය යුතු රොක් පොස්පේට් ප්‍රතිශතය අපේක්ෂිත මට්ටමෙන් තොරවීම හේතුවෙන් මෙට්‍රික් ටොන් 1 ක් රු.27,800 ක් වූ අධිශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP) මෙට්‍රික් ටොන් 334.30 ක් හා මෙට්‍රික් ටොන් 1 ක් රු.20,000 ක් වූ එප්පාවල රොක් පොස්පේට් (ERP) මෙට්‍රික් ටොන් 334 ක් අලෙවි මිලට ආපසු ලබා දීමේදී රු.2,607,540 ක අලාභයක් සමාගමට සිදුවී තිබුණි.

(උ) 2014 වර්ෂයේදී රු.21,226,633 ක ප්‍රාග්ධන වියදමක් දරමින් ආරම්භ කරන ලද වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු 2021 මැයි 05 වන විට නවතා දමා තිබූ අතර මුළු ව්‍යාපෘතිය තුළින් රු.මිලියන 31.71 ක අලාභයක් සිදුවී තිබුණි. තවද, ව්‍යාපෘති කාර්යයන් සඳහා පස් අවුරුදු බදු පදනම මත ලබා ගන්නා ලද ඉඩමෙහි බදු කාලසීමාව 2018 සැප්තැම්බර් 05 දිනෙන් අවසන් වී තිබූ අතර බදු ගිවිසුම අලුත් කිරීමකින් තොරව නිෂ්පාදන කටයුතු පවත්වාගෙන ගොස් තිබුණද 2022 සැප්තැම්බර් මස සිට සමාගමට ව්‍යාපෘති භූමිය තුළට ඇතුළු වීම ඉඩම් හිමිකාර පාර්ශවය විසින් වළක්වා තිබූ අතර එම ආරවුල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාගම විසින් සකස් කර තිබූ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම 2023 පෙබරවාරි 28 දින සංශෝධනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) පරිසර හිතකාමී සහ නවීන ක්‍රියාවලියක් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වීම තුළින් පොස්පේට් පොහොර සඳහා වන ජාතික අවශ්‍යතාවය සපුරාලීම නම් වූ සමාගමේ මෙහෙවරට අනුකූලව සමාලෝචිත වර්ෂය තුළ දී කාර්යභාරයන් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණු අතර රු. 168,600,000 ක ප්‍රතිපාදන මත නිෂ්පාදන හා සේවා වැඩසටහන යටතේ ව්‍යාපෘති 05 ක් හා යටිතල පහසුකම් සංවර්ධනය යටතේ එක් ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණි.

(ii) 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබූ TGM 160 ඇඹරුම් යන්ත්‍රය ස්ථාපනය කර පැයකට මෙට්‍රික් ටොන් 10 ක අමතර නිෂ්පාදනයක් සමාගම අපේක්ෂා කර තිබුණු අතර 2022 සැප්තැම්බර් මස යන්ත්‍රය ස්ථාපිත කර තිබුණි. එසේ වුවද යන්ත්‍රයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට 2023 පෙබරවාරි මස දක්වා කල්ගතවීම හේතුවෙන් අපේක්ෂිත අමතර නිෂ්පාදනය ළඟා කර ගෙන නොතිබුණි.

(එ) සමාගමේ කාර්ය මණ්ඩලය තුළ වූ ප්‍රාථමික මට්ටමේ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරේ අනුමත තනතුරු සංඛ්‍යාව 14 ක් වූ අතර ඉන් සියයට 50 ක් එනම් තනතුරු 7 ක් පුරප්පාඩුව පැවතුණි. එම මට්ටමේ නිෂ්පාදන සහායක තනතුරු 90 න් 7 ක් පුරප්පාඩුව පැවතියදී සේවකයන් 33 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	සට.	2023 මාර්තු 31	2022 මාර්තු 31	*විචලනය*
ආදායම	**17**	546,100,063	741,553,282	(195,453,219)
විකුණුම් පිරිවැය	**18**	(339,448,879)	(394,462,952)	55,014,073
දළ ලාභය		**206,651,184**	**347,090,330**	**(140,439,146)**
කර්මාන්තශාලා සහ පරිපාලන පොදු කාර්යය	**19**	(234,154,076)	(211,834,241)	(22,319,835)
විකුණුම් සහ බෙදාහැරීමේ පිරිවැය	**20**	(11,203,293)	(15,203,221)	3,999,927
මූල්‍ය පිරිවැය	**21**	(9,899,783)	(87,359)	(9,812,424)
මෙහෙයුමෙන් ලද ලාභය		**(48,605,969)**	**119,965,510**	**(168,571,478)**
පොලී සහ වෙනත් ආදායම්	**22**	109,187,619	37,064,579	72,123,040
බදු පෙර ලාභය		**60,581,651**	**157,030,089**	**(96,448,439)**
බදු වියදම	**23**	(25,297,095)	(34,247,300)	8,950,205
වසර සඳහා ලාභය		**35,284,555**	**122,782,789**	**(87,498,234)**
වෙනත් විස්තීර්ණ ආදායම්				
වත්කම් ප්‍රත්‍යාගණනය මත විලම්භිත බදු වගකීම	**24**	(3,494,158)	806,501	(4,300,659)
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයු ගණන අලාභ	**29**	(24,563,329)	24,041,442	(48,604,771)
වර්ෂය සඳහා අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම		(28,057,487)	24,847,943	(52,905,430)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**7,227,068**	**147,630,732**	**(140,403,664)**
කොටසකට ඉපැයුම් (රු.)	**25**	**4.87**	**16.93**	**(12.07)**

21 සිට **29** දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු **5** සිට **20** දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල **අනිවාර්ය** අංගයක් වේ.

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා මුදලින් ප්‍රකාශිතයි)

	සට.	2023 මාර්තු 31	2022 මාර්තු 31	විචලනය
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපල, පිරියත සහ උපකරණ	**5**	287,864,579	322,800,259	(34,935,680)
කොටස්වල ආයෝජනය (GSMB Tech. Services (Pvt) Ltd)	**6**	1,000,000	1,000,000	-
		288,864,579	**323,800,259**	**(34,935,680)**
ජංගම වත්කම්				
තොග	**7**	264,402,806	135,586,812	128,815,994
වෙළඳ ලැබිය යුතු මුදල්	**8**	34,427,525	38,470,668	(4,043,143)
තැන්පතු, පෙරගෙවුම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	**9**	165,628,095	58,541,717	107,086,378
ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්	**10**	560,584,374	580,879,811	(20,295,436)
මුදල් සහ මුදල් සමාන දෑ	**11**	1,468,992	47,626,120	(46,157,129)
		1,026,511,792	**861,105,128**	**165,406,664**
මුළු වත්කම්		**1,315,376,371**	**1,184,905,387**	**130,470,984**
කොටස් සහ වගකීම්				
ප්‍රාග්ධනය සහ සංචිත				
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**12**	72,510,000	72,510,000	-
ප්‍රත්‍යාගණන සංචිත		131,268,117	134,762,275	(3,494,158)
රඳවාගත් ඉපැයුම්		846,967,958	861,246,731	(14,278,773)
මුළු හිමිකම		**1,050,746,075**	**1,068,519,006**	**(17,772,931)**
ජංගම නොවන වගකීම්				
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	**13**	56,358,582	31,310,870	25,047,712
විලම්බිත බදු	**14**	27,618,049	22,269,086	5,348,963
		83,976,631	**53,579,956**	**30,396,675**
ජංගම වගකීම්				
වෙළඳ ගෙවිය යුතු දෑ		22,463,708	1,684,376	20,779,332
පාරිභෝගික අත්තිකාරම්	**8**	2,236,500	1,300,000	936,500
ගෙවිය යුතු ආදායම් බදු	**15**	23,186,666	25,765,717	(2,579,051)
අනෙකුත් ගෙවිය යුතු සහ උපචිත වියදම්	**16**	49,841,648	34,056,333	15,785,315
බැංකු අයිරා	**11**	82,925,144	-	82,925,144
		180,653,666	**62,806,426**	**117,847,240**
මුළු හිමිකම් සහ වගකීම්		**1,315,376,371**	**1,184,905,387**	**130,470,984**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වන බව මම සහතික කරමි.

මූල්‍ය කළමණාකරු

සාමාන්‍යාධිකාරී

21 සිට **29** දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු **5** සිට **20** දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල **අනිවාර්ය** අංගයක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

G.W. MADUSHA UDANI FONSEKA
Director

සභාපති
කොළඹ

අධ්‍යක්ෂක
කොළඹ

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ඉපැයුම්	එකතුව
2021 අප්‍රේල් 01 දිනට ශේෂය	**72,510,000**	**133,955,774**	**744,422,502**	**950,888,275**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	122,782,789	122,782,789
දේපළ, පිරියත හා උපකරණ සඳහා විලම්භිත බදු වගකීම		806,501	-	806,501
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයු ගණන අලාභ	-	-	24,041,442	24,041,442
වර්ෂය තුළ ලාභාංශ ගෙවීම	-	-	(30,000,000)	(30,000,000)
2022 මාර්තු 31 දිනට ශේෂය	**72,510,000**	**134,762,275**	**861,246,732**	**1,068,519,007**
2022 අප්‍රේල් 01 දිනට ශේෂය	**72,510,000**	**134,762,275**	**861,246,732**	**1,068,519,007**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	35,284,555	35,284,555
දේපල, පිරියත **හා** උපකරණ සඳහා විලම්භිත බදු වගකීම - (සටහන 24)		(3,494,158)	-	(3,494,158)
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයු ගණන අලාභ - (සටහන 29)	-	-	(24,563,329)	(24,563,329)
වර්ෂය තුළ ලාභාංශ ගෙවීම	-	-	(25,000,000)	(25,000,000)
2023 මාර්තු 31 දිනට ශේෂය	**72,510,000**	**131,268,117**	**846,967,958**	**1,050,746,076**

21 සිට **29** දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු **5** සිට **20** දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල **අනිවාර්ය** අංගයක් වේ.

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	2023 මාර්තු 31	2022 මාර්තු 31
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
බදු වලට පෙර ලාභය	60,581,651	157,030,089
ගැලපීම් ;		
ක්ෂය වීම	42,699,032	42,132,556
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	9,710,038	552,177
යල් පැන ගිය අයිතම සඳහා ප්‍රතිපාදනය	-	3,421,598
හානිකරණ සඳහා ප්‍රතිපාදන	-	3,450,000
වෙනස්වීම් සඳහා ප්‍රතිපාදන	8,752,383	-
පොලී ආදායම	(104,861,497)	(30,638,969)
ලාභාංශ ආදායම	(300,000)	(500,000)
ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**16,581,607**	**175,447,451**
කාරක ප්‍රාග්ධන වෙනස්කම්		
තොග	(137,568,377)	(34,363,360)
වෙළඳ ලැබිය යුතු දෑ	4,043,143	27,585,868
තැන්පතු, ඉදිරියට කල ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු දෑ	(10,830,351)	2,282,033
වෙළඳ ගෙවිය යුතු දෑ	20,779,332	(8,063,314)
පාරිභෝගික අත්තිකාරම්	936,500	-
අනෙකුත් ගෙවිය යුතු සහ උපචිත වියදම්	14,901,928	(9,106,052)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ (යෙදවූ) මුදල් ප්‍රවාහය	**(91,156,218)**	**153,782,626**
ගෙවූ ආදායම් බදු	(25,861,838)	(24,983,572)
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ගෙවීම	(9,225,655)	(1,518,110)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ (යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය	**(126,243,711)**	**127,280,944**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපල,පිරියත හා උපකරණ මත ආයෝජනය	(6,879,966)	(6,686,075)
ප්‍රාග්ධන නොනිමි	-	(16,223,589)
ලැබූ පොලී	8,445,966	30,638,969
කෙටිකාලීන තැන්පතු වල ආයෝජන	20,295,436	(119,754,996)
ලැබූ ලාභාංශ	300,000	500,000
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ (යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය	**22,161,436**	**(111,525,691)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
ගෙවූ ලාභාංශ	(25,000,000)	(30,000,000)
මූල්‍ය ක්‍රියාකරකම් වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(25,000,000)**	**(30,000,000)**
වර්ෂය තුළ මුදල් සහ මුදල් සමාන දෑ වල සිදුවූ ශුද්ධ වෙනස්වීම්	**(129,082,274)**	**(14,244,747)**
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	47,626,121	61,870,868
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන 11)	**(81,456,153)**	**47,626,121**
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වලින් නිරූපනය කරනු ලබන්නේ ;	**2023 මාර්තු 31**	**2022 මාර්තු 31**
අතැනි මුදල් සහ බැංකු	1,468,992	47,626,121
බැංකු අයිරාව	(82,925,144)	-
	(81,456,153)	**47,626,121**

21 සිට **29** දක්වා පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු **5** සිට **20** දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල **අනිවාර්ය** අංගයක් වේ.

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

5 දේපල,පිරියත හා උපකරණ

පිරිවැය/ ප්‍රත්‍යාගණනය	2022 අප්‍රේල් 01 දිනට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්	2023 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	150,248,121	-	-	150,248,121
අභ්‍යන්තර **මාර්ග**	65,139,730	-	-	65,139,730
යන්ත්‍ර සහ පිරියත	90,011,998	36,450,928	-	126,462,926
මෝටර් වාහන	96,515,000	-	-	96,515,000
කාර්යාල උපකරණ	7,422,593	188,865	-	7,611,457
විදුලි උපකරණ	2,790,052	1,269,348	-	4,059,400
ලී බඩු සහ සවිකිරීම්	8,411,858	584,044	-	8,995,902
විදුලි අලි වැට	-	3,157,194	-	3,157,194
පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	8,434,724	29,500	-	8,464,224
	428,974,076	**41,679,878**	**-**	**470,653,954**

ක්ෂය වීම	2022 අප්‍රේල් 01 දිනට ශේෂය	වර්ෂය සඳහා	මාරුකිරීම්	2023 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	17,816,417	6,009,925	-	23,826,342
අභ්‍යන්තර **මාර්ග**	25,893,986	3,247,924	-	29,141,909
යන්ත්‍ර සහ පිරියත	26,689,283	8,882,948	-	35,572,231
මෝටර් වාහන	57,909,000	19,303,000	-	77,212,000
කාර්යාල උපකරණ	4,307,354	1,515,513	-	5,822,867
විදුලි උපකරණ	200,900	314,351	-	515,251
ලී බඩු සහ සවිකිරීම්	4,572,290	1,737,441	-	6,309,731
විදුලි අලි වැට	-	-	-	-
පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	3,057,514	1,687,930	-	4,745,444
	140,446,742	**42,699,032**	**-**	**183,145,775**

ශුද්ධ පොත් අගය	2022 අප්‍රේල් 01 දිනට ශේෂය	වර්ෂය සඳහා	මාරුකිරීම්	2023 මාර්තු 31 දිනට ශේෂය
ගොඩනැගිලි	132,431,704	(6,009,925)	-	126,421,779
අභ්‍යන්තර **මාර්ග**	39,245,745	(3,247,924)	-	35,997,821
යන්ත්‍ර සහ පිරියත	63,322,715	27,567,979	-	90,890,695
මෝටර් වාහන	38,606,000	(19,303,000)	-	19,303,000
කාර්යාල උපකරණ	3,115,239	(1,326,649)	-	1,788,590
විදුලි උපකරණ	2,589,152	954,997	-	3,544,149
ලී බඩු සහ සවිකිරීම්	3,839,569	(1,153,397)	-	2,686,171
විදුලි අලි වැට	-	3,157,194	-	3,157,194
පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	5,377,210	(1,658,430)	-	3,718,780
	288,527,334	**(1,019,154)**	**-**	**287,508,179**

කාරක ප්‍රග්ධනය	2022 අප්‍රේල් 01 දිනට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්	2023 මාර්තු 31 දිනට ශේෂය
නව කම්හල ස්ථාපනය කිරීම	7,440,000		(7,440,000)	-
නව TGM 160 කම්හල	29,926,525	2,363,593	(32,290,118)	-
පරිශ්‍රයේ විදුලි උත්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම	356,400			356,400
විදුලි අලි වැට	-	2,273,807	(2,273,807)	-
	37,722,925	**4,637,400**	**(42,003,925)**	**356,400**
එකතුව	**326,250,259**			**287,864,579**
හානිකරණය සඳහා වෙන්කිරීම්	**(3,450,000)**		3,450,000.00	**-**
	322,800,259			**287,864,579**

	2023 මාර්තු 31	*2021/22*
6 **GSMB** ටෙක්නිකල් **සර්විසස්** (පුද්ගලික) සමාගමේ ආයෝජනය		
එකක් රුපියල් 10 බැගින් වූ කොටස් 100,000	**1,000,000**	**1,000,000**

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

		2023 මාර්තු 31	*2021/22*
7	**තොග**		
	වෙළඳ තොග - එප්පාවල (අවසාන නිමි)	70,278,082	18,916,760.91
	(අමුද්‍රව්‍ය තොග)	35,899,293	22,199,493.23
	සාමාන්‍ය තොග	177,657,742	101,700,487
		283,835,118	**142,816,741**
	යල්පැන ගිය තොග සඳහා වෙන්කිරීම	(10,679,929)	(7,229,929)
	තොග වෙනස්කම් සඳහා ප්‍රතිපාදන	(8,752,383)	-
		264,402,806	**135,586,812**

7.1 තොග වෙනස්කම් සඳහා ප්‍රතිපාදන - අමුද්‍රව්‍ය

සමාගම 2023.03.31 දිනට පහත සඳහන් පරිදි අමුද්‍රව්‍යවල භෞතික හා පොත් ශේෂවල වෙනසක් හඳුනාගෙන ඇත.

ප්‍රමාණය (මෙ.ටෝ.)	***ERP***	***HERP***
පොත් ශේෂය	16194	816
භෞතික සත්‍යාපනයට අනුව ශේෂය	12742	121
හිඟය	3452	695

වටිනාකම -(රු.)	***ERP***	***HERP***
පොත් ශේෂය	34,177,976.32	1,721,628.45
භෞතික සත්‍යාපනයට අනුව ශේෂය	26,892,625.45	254,596.84
වෙනස	7,285,350.87	1,467,031.61
මුළු වෙනස (රු.)		**8,752,382.48**

සමාගම් තොග සත්‍යාපන පරාමිතීන් හඳුන්වා දීමට සහ ඒ අනුව තොග වෙනස තක්සේරු කිරීමට ස්වාධීන ඉංජිනේරු වාර්තාවක් කැඳවා ඇත.ඉංජිනේරුවන්ට අනුව, ඉහත වෙනස සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වසර ගණනාවක් තුළ අමුද්‍රව්‍ය තොග ගොඩගැසීමේ ක්‍රමයේ වෙනස්වීම් සහ කැනීම් නිමැවුමේ ඉහළ තෙතමනයක් තිබීමයි.අධ්‍යක්ෂ මණ්ඩලය, වෙනසෙහි ඇති ප්‍රමාණාත්මකබව සැලකිල්ලට ගනිමින්, ඉහත වෙනස නිවැරදිව නිර්වචනය කර නිවැරදි කරන තෙක් 2022/23 මූල්‍ය ප්‍රකාශය තුළ අවශ්‍ය ප්‍රතිපාදන සකස් කිරීමට සහ හෙළිදරව් කිරීමට කිරීමට තීරණය කළේය.

2023 මාර්තු 31 දිනට ගැලපීම්

		ලාභදායිතාවයට වන බලපෑම
ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සිදු කරන ලද ගැලපීම - තොග ගැලපීම- අමුද්‍රව්‍ය		(8,752,382)
		වගකීම් වලට වන බලපෑම
ධාරණ අගයන් ගැලපීම- තොග වෙනස සඳහා ප්‍රතිපාදන		8,752,382

8	**වෙළඳ ලැබිය යුතු දේ**		
	ණයගැනි විකුණුම් ERP/HERP - එප්පාවල		
	2023.03.31 දිනට ලැබිය යුතු ණයගැනි	42,978,725	47,628,225
	ලැබූ ණයගැනි අත්නිකාරම්	(2,236,500)	(1,300,000)
		40,742,225	**46,328,225**
	මූදලට විකුණුම් වල එකතු ගිණුම - එප්පාවල	-	-
	ණය ගැනියන් - පොල් පොහොර ව්‍යාපෘතිය - වාරියපොල	1,218,307	1,410,447
	(-) බොල් සහ අඩමාණ ණය සඳහා වෙන් කිරීම		
	- එප්පාවල පරිශ්‍රය	(8,551,200)	(8,551,200)
	- වාරියපොල පරිශ්‍රය	(1,218,307)	(2,016,804)
		(9,769,507)	**(10,568,004)**
		32,191,025	**37,170,668**
9	**තැන්පතු, කලින් ගෙවූ සහ වෙනත් ලැබිය යුතු දෑ**		
	සේවක ණය සහ අත්තිකාරම්	38,112,325	44,232,680
	තැන්පතු සහ ඉදිරියට ගෙවීම්	32,510,904	5,091,398
	කෙටි කාලීන ආයෝජන වලින් ලැබිය යුතු (ස්ථාවර තැන්පතු) පොලී ආදායම	95,004,865	9,182,035
	කෙටි කාලීන ආයෝජන වලින් ලැබිය යුතු **(රෙපෝ)** පොලී ආදායම	-	35,604
		165,628,095	**58,541,717**

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

		2023 මාර්තු 31	*2021/22*
10	**ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්**		
	ස්ථාවර තැන්පතු	560,584,374	580,879,811
		560,584,374	**580,879,811**
11	**මුදල් සහ මුදල් සමාන දෑ**		
	රෙපෝ - ලංකා බැංකුව	-	24,000,000
	බැංකුවේ ඇති මුදල්	1,353,991	23,496,120
	අතැති මුදල්	101,000	126,000
	මුද්දර සංචිතය	14,000	4,000
		1,468,991	**47,626,120**
	11.1 - බැංකුවේ ඇති මුදල්		
	ලංකා බැංකුව - එප්පාවල (A/C No 004641100)	373,959	9,370,437
	මහජන බැංකුව - එප්පාවල (170-100180000025)	808,713	4,574,627
	මහජන බැංකුව වාරියපොළ - (A/C No 144-100200000025)	171,319	334,689
	ලංකා බැංකුව - ග්‍රෑන්ඩ් පාස් (A/C No 0009300713)	-	9,216,368
		1,353,991	**23,496,120**
	බැංකු අයිරා		
	මහජන බැංකුව - එප්පාවල	-	-
	මහජන බැංකුව වාරියපොළ	-	-
	ලංකා බැංකුව - එප්පාවල	-	-
	ලංකා බැංකුව - ග්‍රෑන්ඩ් පාස් - (A/C No 0009300713)	82,925,144	-
		82,925,144	**-**
12	**ප්‍රකාශිත ප්‍රාග්ධනය**		
	නිකුත් කර සම්පූර්ණයෙන්ම ගෙවා ඇත		
	සාමාන්‍ය කොටස් 7,251,000	**72,510,000**	**72,510,000**
13	**විශ්‍රාම ප්‍රතිලාභ වගකීම**		
	2022 අප්‍රේල් 01 දිනට ශේෂය	**31,310,870**	**56,318,245**
	වත්මන් සේවා පිරිවැය	2,038,120	1,867,198
	අතීත සේවා පිරිවැය	2,975,288	(5,268,562)
	වර්ෂය සඳහා පොලී වියදම	4,696,630	3,953,541
	වර්ෂය තුල ගෙවීම්	(9,225,655)	(1,518,110)
	විශ්‍රාම බැදියාව මත ආයු ගණන අලාභය	24,563,329	(24,041,442)
	2023 මාර්තු 31 දිනට ශේෂය	**56,358,582**	**31,310,870**
14	**විලම්භිත බදු**		
	වර්ෂයේ ආරම්භක ශේෂය	22,269,086	21,903,935
	ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගන්නා ලද	1,854,805	1,171,652
	වෙනත් **විස්තීර්ණ** ආදායම් තුල හඳුනා ගන්නා ලද	3,494,158	(806,501)
	වර්ෂය අවසාන ශේෂය	**27,618,049**	**22,269,086**

15	**බදු අය කිරීම සඳහා ප්‍රතිපාදන**				
